ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
இலங்கை பத்திரிகை முறைப்பாட்டு ஆணைக்குழு
Press Complaints Commission of Sri Lanka

96, Kirula Road, Colombo 05, Sri Lanka
Tel : (+94 11) 5353635
Fax : (+94 11) 5335500
E-mail: srockwoodl@pccsl.lk
Web: www.pccsl.lk

# කර්තෘවරු 'පාඨක අයිතිය' යටතේ පැමිණිලි 300 ක් සෘජුවම විසඳගනිති

ජාතික පුවත්පත්වල කර්තෘවරුන් වෙත පසුගිය 2019 වසරේදී 'පාඨක අයිතිය' යටතේ සෘජුවම ලැබුණු පැමිණිලි 300 ක් සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ මැදිහත්වීමෙන් විසඳගත් පැමිණිලි 20 ත් සමග පැමිණිලි 324 ක් විසඳගැනීමට සමත්ව ඇත. අදාළ වසර තුළදී ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත පැමිණිලි 83 ක් ලැබී ඇති අතර ඒ අතරින් පැමිණිලි 13 ක් පුවත්පත් පැමිණිලි කොමිසමේ විෂයපථයට අදාළ නොවන පැමිණිලි වේ.

ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ප්‍රතිපත්ති මාලාවේ 4 වන පරිච්ඡේදයේ සඳහන් 'පිළිතුරු දීමට අවස්ථා' යටතේ එම පැමිණිලි විසඳගැනීමට කර්තෘවරුන් සමත්ව ඇත. වෘත්තීය ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම යම් සීමාවක් යටතේ තෙවන පාර්ශවීය පැමිණිලි සඳහා ද අවස්ථාව විවෘත්ත කර ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රධාන විධායක නිලධාරී සුකුමාර් රොක්වුඩ් මහතා විසින් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වාර්ෂික මහා සභාව වෙත ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාවේ ඒ බව සදහන්ව ඇත. එම කොමිසමේ වාර්ෂික මහා සභාව පසුගිය ඔක්තෝබර් 21 දින සූම් මෘදුකාංග තාක්ෂණය ඔස්සේ සාර්තකව පැවැත්වුණි.

එමෙන්ම ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පසුගිය 2019 වසරේදී පුවත්පත් ප්‍රකාශකයන්, කතුවරුන්, උප කතුවරුන්, ජනමාධ්‍යවේදීන් හා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් සමග පැවති රැස්වීම් 17 කදී 252 දෙනෙකු හමුවී සාකච්ඡා පවත්වා ඇත. එමෙන්ම විවිධ වෘත්තීය ක්ෂේත්‍ර නියෝජනය කරන සිවිල් සමාජ නියෝජිතයින් සමග පැවති රැස්වීම් 13 කදී නියෝජිතයන් 343 දෙනෙක් දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

ස්වාධීන ස්වයං නියාමන ආයතනය වන ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම 2020(මෙම) වසරේ ඔක්තෝබර් 15 දිනට වසර 17 ක් සම්පූර්ණ විය. ශ්‍රී ලංකා පුවත්පත් හිමිකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය, දෙමල මාධ්‍ය සංධානය සහ දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සම්මේලනයේ ශ්‍රී ලංකා පාර්ෂවයේ සහයෝගය ලබයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමථකරණය, මැදිහත්කරණය සහ බේරුම්කරණ මූලධර්ම යටතේ ක්‍රියා කරයි. ආරවුල් නිරාකරණ මන්ඩලයේ සභාතිවරයා ඇතුළුව ජනමාධ්‍ය නොවන සිවිල් සමාජ නියෝජිතයන් හයදෙනෙකුගෙන් සහ ජනමාධ්‍ය නියෝජිතයන් පස්දෙනෙකුගෙන් සමන්විත වේ. පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම් නිහාල් සෙනවිරත්න මහතාගේ සභාපතීත්වයෙන් යුතු එම මණ්ඩලයේ ආචාර්ය දෙවනේසන් නේසයියා, නීතීඥ ජාවිඩ් යුසුෆ්, ඩයන් සකූර්මන් මහතා, ලුසිල් විජේවර්ධන මහතා, ඥානා මුණසිංහ මහත්මිය, සිරි රනසිංහ මහතා, පී. බාලසිංහම් මහතා, දයා ලංකාපුර මහතා, ප්‍රමෝද් ද සිල්වා මහතා සහ රජිතා වීරකෝන් මහත්මිය අනෙකුත් සාමාජිකයෝ වෙති.

සාමාජිකයන් නවදෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති කුමාර් නඩේසන් මහතා(ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ නාමයෝජනාවකි) උප සභාපති සිංහ රත්නතුංග මහතා(ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ නාමයෝජනාවකි) නිමල් වෙල්ගම මහතා(ශ්‍රී ලංකා පුවත්පත් ප්‍රකාශකයින්ගේ සංගමයේ නාමයෝජනාවකි) මනික් ද සිල්වා මහතා(ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ නාමයෝජනාවකි) ලසන්ත ද සිල්වා මහතා (නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නාමයෝජනාවකි) ෆ්‍රෑන්ක් ද සොයිසා මහතා(වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ නාමයෝජනාවකි) සූම් තාක්ෂණය ඔස්සේ පැවති එම සමුළුවේ දී සිරි රණසිංහ මහතා, එන්. එම්. අමීන් මහතා, මොහාන් ලාල් පියදාස මහතා, සාමාන්‍ය සාමාජිකත්වයෙනුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ වශයෙන් මෙවර නැවතත් තේරී පත්වූහ.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ විගණන කටයුතු සඳහා අර්නස් ඇන්ඩ් යං සමාගමත් එෆ් ජේ සහ ජී ද සේරම් පුද්ගලික සමාගම ලේකම්වරුන් ලෙසත් නැවත තේරිපත්විය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් කාර්යාලය ප්‍රධාන විධායක නිලධාරී සුකුමාර් රොක්වුඩ් සහ පැමිණිලි නිලධාරී කමල් ලියනආරච්චි මහත්වරුන්ගෙන් සමන්විත වේ. අවසන්

2020 ඔක්තෝබර් 24